පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත
மாகாணக் கல்வித் திணைக்களம் - வட மத்திய மாகாணம்
Department of Education - North Central Province

ශ්‍රේණිය
10

තෙවන වාර පරීක්ෂණය - 2022

විෂයය - කෘෂි හා ආහාර තාක්ෂණය I, II

පාසලේ නම :- ....

ඇතුළත්වීමේ අංකය :- ....   කාලය : පැය 03

කෘෂි හා ආහාර තාක්ෂණය I

උපදෙස්

- ❖ සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- ❖ අංක 01 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති 1, 2, 3, 4 පිළිතුරුවලින් වඩාත් ගැලපෙන පිළිතුරු තෝරාගන්න.
- ❖ ඔබට දී ඇති පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන්, ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.
- ❖ එම පිළිතුරු පත්‍රයේ දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා ඒවා පිළිපදින්න.

01. කලාවැවේ සිට තිසාවැවට ජලය රැගෙන යාමට ඉදිකරන ලද ජයගඟ හෙවත්, යෝධ ඇළ, අතීතයේ ශ්‍රී ලංකාවේ පැවැති දියුණු වාරි තාක්ෂණයට නිදසුනකි. මෙම ඇළ ඉදිකරන ලද්දේ,

1. ධාතුසේන රජතුමා විසිනි   2. අග්බෝ රජතුමා විසිනි
3. මහසෙන් රජතුමා විසිනි   4. මහා පරාක්‍රමබාහු රජතුමා විසිනි

02. හරිත විප්ලවය නිසා ශ්‍රී ලංකාව තුළ ඇති වූ වෙනසක් නම්,

1. අත්තම් ක්‍රමයට වැඩ කිරීමෙන් ගොවින් අතර එකමුතුකම තහවුරු වීමයි.
2. කෘෂිකර්මය හා බැඳුණු ජනකථා මගින් සංස්කෘතිය පෝෂණය වීමයි.
3. බෝගවලට කාමනික පොහොර යෙදීමට ගොවීන් පෙළඹවීමයි
4. වැඩිදියුණු කරන ලද බෝග ප්‍රභේද වගා කිරීමෙන් අස්වනු වැඩිවීමයි.

03. වායු ගෝලයේ සාපේක්ෂ ආර්ද්‍රතාව වැඩි වූ විට,

1. ශාකවල උත්ස්වේදනය වැඩි වේ.   2. ශාක රෝග පැතිරීම වැඩි වේ.
3. කෘෂි පළිබෝධ පැතිරීම අඩු වේ.   4. ධාන්‍යවල ගබඩා කාලය වැඩි වේ.

04. යම් ප්‍රදේශයක වායු ගෝලීය උෂ්ණත්වය ඉහළයාමට හේතුවක් විය හැක්කේ එම ප්‍රදේශයේ,

1. ජලාශ බහුලව පැවතීම ය   2. වෘක්ෂලතා බහුලව පැවතීම ය
3. ගොඩනැගිලි බහුලව පැවතීම ය   4. ඉහළ උච්චත්වය ය

05. ශ්‍රී ලංකාවේ වගා කන්න, එම කන්නවලට වර්ෂාව ලබාදෙන මෝසම් සුළඟ සහ වර්ෂාව ලැබෙන මාස නිවැරදිව දැක්වෙන්නේ පහත වගුවෙහි කුමන පේළියෙහිද?

	වගා කන්නය	මෝසම් සුළඟ	වර්ෂාව ලැබෙන මාස
1	යල	නිරිත දිග	නොවැම්බර් සිට අප්‍රේල් දක්වා
2	යල	ඊශාන දිග	මැයි සිට සැප්තැම්බර් දක්වා
3	මහ	නිරිත දිග	මාර්තු සිට අගෝස්තු දක්වා
4	මහ	ඊශාන දිග	දෙසැම්බර් සිට පෙබරවාරි දක්වා

06. ආග්නේය පාෂාණයක් වූ ග්‍රැනයිට් විපරිත වීමෙන් සෑදෙනුයේ,

1.	මා බල් (කිරිගරුඬය)	2.	නයිස් ය
3.	ක්වාට්ස් ය.	4.	පෙග්මටයිට් ය

07. පස සෑදීමේ ක්‍රියාවලියේ දී මාතෘ පාෂාණය ජීර්ණය වී මාතෘ ද්‍රව්‍ය සෑදේ. මෙම මාතෘ ද්‍රව්‍ය පාංශු පැතිකඩෙහි කුමන කලාපයේ දක්නට ලැබේද?

1.	A කලාපයේ	2.	B කලාපයේ
3.	C කලාපයේ	4.	O කලාපයේ

08. ශිෂ්‍යයෙක් පෝච්චියක මිරිස් පැළයක් සිටුවා එයට වැඩිපුර ජලය යෙදුවේය. පෝච්චියේ පතුලේ ඇති සිදුරෙන් අතිරික්ත ජලය සියල්ල බැස ගිය පසු එහි ඇති පසෙහි අඩංගු වන්නේ,

1. කේශාකර්ෂණ ජලය හා ගුරුත්වාකර්ෂණ ජලයයි
2. ජලාකර්ෂණ ජලය හා කේශාකර්ෂණ ජලයයි
3. ජලාකර්ෂණ ජලය හා ගුරුත්වාකර්ෂණ ජලයයි
4. කේශාකර්ෂණ ජලය පමණි.

09. පසෙහි කැටායන හුවමාරු ධාරිතාව ඉහළ නැංවීමට දායක වන පාංශු සංඝටක වනුයේ,

1.	මැටි හා හියුමස් ය	2.	රොන්මඩ හා මැටි ය
3.	රොන්මඩ හා සියුම් වැලිය	4.	රොන්මඩ හා හියුමස්ය.

10. ශාක කුල පදනම් කරගත් බෝග වර්ගීකරණය කෘෂිකර්මයේදී වැදගත් වේ. ෆැබේසියේ කුලයට අයත් බෝග කාණ්ඩය වනුයේ,

1.	මෑ, උඳු සහ කව්පි ය	2.	බඩඉරිඟු ,සෝයා බෝංචි සහ කුරක්කන් ය
3.	අර්තාපල්, තක්කාලි හා මිරිස් ය	4.	වට්ටක්කා, පතෝල සහ වම්බටු ය

11. ප්‍රාථමික බිම් සැකසීම, ද්විතියික බිම් සැකසීම මෙන්ම අතුරුයත්ගැටේදී ද භාවිත කළ හැකි උපකරණයකි.

1.	උදැල්ල	2.	හැඩ ලැලි නගුල
3.	අත්මුල්ලුව	4.	කොකු නගුල

12. පහත රූප සටහනෙහි දැක්වෙන්නේ අසම්පූර්ණ රෝග ත්‍රිකෝණයකි. මෙහි A අක්ෂරය මගින් පෙන්නුම් කරනුයේ,

1.	වාහකයා ය	2.	ධාරකයා ය
3.	උෂ්ණත්වය ය	4.	තෙතමනය ය



13. බෝග වගාව සඳහා කරනු ලබන බිම් සැකසීම සම්බන්ධව වැරදි ප්‍රකාශය කුමක්ද?

1. අතුරුයත්ගෑම සිදුකරන්නේ බෝග සංස්ථාපනයට පසුය.
2. බිම් සැකසීම මගින් බෝග වර්ධනයට හිතකර පාංශු තත්ව සපයනු ලැබේ.
3. මනාව බිම් සැකසීමෙන් පසේ ජලවහනය දුර්වල වේ.
4. බිම් සැකසීමෙන් පසෙහි ජල අවශෝෂණ හැකියාව දියුණු වේ.

14. එළවළු බීජ තවාන් සඳහා සකසන ලද එකිනෙකට ආසන්නව පිහිටි සම්මත තවාන් පාත්ති දෙකක සිරස් කඩ පෙනුම රූපයේ දැක්වේ.



1. 120cm - 50cm
2. 110cm - 40cm
3. 100cm - 30cm
4. 90cm - 20cm

15. ක්ෂේත්‍රයේ සිටුවීමේ දී පැළයේ මූල්වලට සිදුවන හානිය අවම කිරීමේ අරමුණ ඇතිව සකසනු ලබන තවාන් වර්ගය නම්,

1. මඩ තවාන් ය
2. ඩැපොග් තවාන් ය
3. පෙට්ටි තවාන් ය
4. නෙරිදෝකෝ තවාන් ය

16. මෙම රූපයේ දැක්වෙන්නේ ජල සම්පාදන ක්‍රමයකදි ශාකය අවට සැකැස්මකි. එම ජල සම්පාදන ක්‍රමය විය හැක්කේ,

1. ඇලි ජල සම්පාදනයයි
2. තීරු ජල සම්පාදනයයි.
3. වළලු ජල සම්පාදනයයි
4. බේසම් ජල සම්පාදනයයි.

17. ශාකවලට අත්‍යාවශ්‍ය මහා පෝෂක පමණක් අඩංගු වරණය කුමක්ද?

1. කාබන්, නයිට්‍රජන් හා බෝරෝන්
2. කාබන්, හයිඩ්‍රජන් හා ඔක්සිජන්
3. ඔක්සිජන්, පොස්පරස් හා ක්ලෝරයිඩ්
4. කැල්සියම්, මැග්නීසියම් හා සින්ක්

18. වගා ක්ෂේත්‍රයකින් අතිරික්ත ජලය ඉවත් කිරීම සඳහා යොදාගනු ලබන කානු පද්ධතියක් රූපයේ දැක්වේ. එම කාණු පද්ධතිය හඳුන්වන්නේ,



1. ග්‍රිඩ් අයන් ලෙස ය.
2. සමාන්තර ලෙස ය.
3. හෙරිංබෝන් ලෙස ය.
4. කොඩොල් කාණු පද්ධතිය ය

19. දුර්වල ජල වහනය නිසා බෝග වගාවක ඇතිවිය හැකි තත්ත්වයක් වනුයේ,

1. ස්වායු පාංශු ජීවීන්ගේ ගහණය වැඩිවීම ය.
2. බෝගයේ මුල් ආශ්‍රිත රෝග අඩුවීම ය.
3. බෝගයේ මූල පද්ධතිය ගැඹුරට වර්ධනය වීම ය.
4. කාබනික ද්‍රව්‍ය වියෝජනයෙන් මීතෙන් වායුව නිපදවීම ය.

20. වල් පැළෑටි පිළිබඳව දැක්වෙන ප්‍රකාශ අතුරෙන් නිවැරදි ප්‍රකාශ තෝරාන්න.

A. පළල් පත්‍ර වල් පැළෑටිවල ඇත්තේ ජලාකාර නාරටි වින්‍යාසයක් සහිත පත්‍රය.

B. තෘණ ශාකවල තන්තුමය මූල පද්ධතියක් ඇත.

C. පන් වර්ගයේ වල් පැළෑටිවල කඳ කුහර සහිතය.

1. A හා B පමණි
2. A හා C පමණි
3. B හා C පමණි
4. A, B හා C සියල්ලම

21. රූපයේ දැක්වෙන ඇටවුම භාවිත කරනු ලබන්නේ,



1. අවුලක පෝරා කෘමියා පාලනය සඳහා ය.
2. කුඩිත්තා පාලනය සඳහා ය.
3. පිටි මකුණා පාලනය සඳහා ය.
4. පලතුරු මැස්සා පාලනය සඳහා ය.

22. කෙසෙල් ශාකයක පත්‍ර කුඩා වී එකිනෙකට ආසන්නව (සෙව්වන්දියක් ආකාරයට) සැකසී එහි වර්ධනය බාල විය. මෙම තත්ත්වයට හේතු විය හැක්කේ,

1. බැක්ටීරියා ආසාදනය යි	2. වෛරස් ආසාදනය යි
3. දිලීර ආසාදනය යි	4. වටපණු ආසාදනය යි

23. පස් සාම්පලයක් බීකරයකට දමා ජලය සමග හොඳින් කලතා තැන්පත්වීමට ඉඩ හැරිය විට තැන්පත් නොවී වැඩි වේලාවක් ජලය සමග අවලම්බනයත් සේ පවතින්නේ,

1. සියුම් වැලි ය	2. රළු වැලි ය
3. රොන් මඩ ය	4. මැටි ය

24. පහත ලක්ෂණ සහිත පස් වර්ගය, දී ඇති වරණ අතරින් තෝරා දක්වන්න.

❖ ගංගා දෙපස තැන්පත්ව ඇත.
❖ මැටි හා රෝනමඩවලින් යුත් සාරවත් පසකි.
❖ දර්ශිය පාංශු පැතිකඩක දැකිය නොහැකිය.
❖ වී, එළවළු හා පලා බෝග වගා කළ හැකිය.

1. රතු දුඹුරු පස	2. රතු කහ පෙඩ්සොලික් පස
3. දියලු පස	4. රෙගොසොල්ස් පස

25. බෝග වගාවට සුදුසු පසක තිබිය යුතු පාංශු සංඝටක ප්‍රතිශතවලින් නිවැරදිව දක්වා ඇති සංඝටකය ඇතුළත් වරණය තෝරන්න.

1. ඛනිජ 40%	2. කාබනික ද්‍රව්‍ය 5%
3. ජලය 20%	4. වාතය 20%

26. පසේ ආම්ලිකතාවය ඉවත් කිරීම සඳහා පසට යෙදිය හැකි ද්‍රව්‍ය/ද්‍රව්‍යයන් වන්නේ,

1. කැල්සියම් කාබනේට්	2. ඩොලමයිට්
3. පිළිස්සු හුණු	4. ඉහත සඳහන් සියල්ලම

27. වැහි බිංදු පස් මත වැටෙන විට පස් අංශු දේහයෙන් වෙන් වීම,

1. ස්ථරිය ඛාදනයයි	2. විසිරි ඛාදනයයි
3. ඇලි ඛාදනයයි	4. ඇඟිලි ඛාදනයයි

28. පහත සඳහන් බෝග අතරින් අපනයන ආර්ථික බෝග වන්නේ,

1. මුං, කව්පි හා ගම්මිරිස් ය	2. කෝපි, කුරුඳු හා බඩ ඉරිඟු ය
3. ගම්මිරිස්, කුරුඳු හා පුවක් ය	4. ඇන්තුරියම්, පුවක් හා කව්පි ය

29. යන්ත්‍ර බලයෙන් ක්‍රියාකරවන, ද්විතියික බිම් සැකසීමේ උපකරණයක් වන්නේ,

1. හැඩලැලි නගුල ය	2. ජපන් පරිවර්ත්‍ය නගුල ය
3. තැටි නගුල ය	4. දැති පෝරුව ය

30. තෙත් කලාපයේ මිරිස් බීජ තවාන් දැමීම සඳහා, ක්ෂේත්‍රයේ සකසා ගැනීමට වඩාත් යෝග්‍ය තවාන් පාත්ති වර්ගයකි.

1. ගිල් වූ තවාන් 2. උස් තවාන් 3. කුට්ටි තවාන් 4. තැටි තවාන්

31. තවාන් සඳහා මාධ්‍ය ලෙස යොදා ගන්නා ද්‍රව්‍ය හා ඒවායේ අනුපාත වනුයේ,

1. කොම්පෝස්ට් හා හලාගත් මතුපිට පස් 1:1 අනුපාතයට ය.
2. ගොම පොහොර හා මතුපිට පස් 2:1 අනුපාතයට ය.
3. ගොම පොහොර කුකුල් පොහොර හා මතුපිට පස් 2:1:1 අනුපාතයට ය.
4. හලාගත් මතුපිට පස් හා හලාගත් කොම්පෝස්ට් 1:2 අනුපාතයට ය.

32. බෝග වගාව සඳහා ජල සම්පාදනයත් සමග රසායනික පොහොර ලබාදීමට සුදුසු ජල සම්පාදන ක්‍රමය වන්නේ,

1. තීරු ජල සම්පාදනයයි. 2. ඇලි ජල සම්පාදනයයි.
3. බිංදු ජල සම්පාදනයයි 4. වළලු ජල සම්පාදනයයි.

33. දියර පොහොර භාවිත කිරීමේ දී, එම පොහොර මිශ්‍රණය ශාක පත්‍රවලට ඉසිනු ලබන්නේ,

1. පත්‍ර මත තෙතමනය රැඳිය යුතු බැවිනි
2. පත්‍ර මගින් පෝෂක අවශෝෂණය කරන බැවිනි
3. පත්‍ර කා දමන කැමින් පාලනය කිරීමටය
4. පසට යෙදීමෙන් සිදුවන පෝෂක හානිවීම වැළැක්වීමට ය

34. කොම්පෝස්ට් නිපදවීමේ දී ඒ සඳහා යොදාගන්නා අමුද්‍රව්‍ය මිශ්‍රණයට මුහුම් ලෙස කොම්පෝස්ට් ස්වල්පයක් යොදාගැනීමේ අරමුණ වන්නේ,

1. අමුද්‍රව්‍ය මිශ්‍රණය ජීර්ණයට අවශ්‍ය ක්ෂුද්‍ර ජීවීන් එක් කිරීමය.
2. අමුද්‍රව්‍ය මිශ්‍රණය ජීර්ණයට අවශ්‍ය තෙතමනය ලබාදීමය.
3. කොම්පෝස්ට්වලට පෝෂණ ද්‍රව්‍ය එක් කිරීමය.
4. කොම්පෝස්ට්වලට පෝෂණ ද්‍රව්‍ය එක් කිරීමය.

35. පහත සඳහන් වරණ අතුරින් තෘණ කාණ්ඩයට පමණක් අයත් වල් පැළෑටි සහිත පිළිතුර තෝරන්න.

1. ජපන්ජබර, තුනැස්ස, බටදැල්ල 2. බටදැල්ල, ඉලුක්, බජිරි
3. කලාදුරු, කුප්පමේණියා, දියහබරල 4. තුනැස්ස, බැලතණ, හුලංතලා

36. නිවිති වගාවක පැළ කිහිපයක් කහපාට වීම හා මැලවීම පෙන්නුම් කළ අතර, ඒවාට ජල සම්පාදනය කළ ද යථා තත්ත්වයට පත් නොවුණි. එම ශාක ගලවා බැලූ විට මුල්වල ගැට වැනි ව්‍යුහ ඇති බව දැකගත හැකි විය. එම තත්වයට හේතු විය හැක්කේ,

1. මූල ගැටිතිවල නයිට්‍රජන් තිර කිරීම ය.
2. මුල්වල දිලීර ආසාදනයක් ය.
3. මුල්වල බැක්ටීරියා ආසාදනයක් ය.
4. මුල්වල වටපණු ආසාදනයක් ය

37. බෝගවලට හානිකරන පලතුරු මැස්සාගේ ජීවන චක්‍රය දක්වා ඇති නිවැරදි වරණය තෝරන්න.

1. බිත්තර ⟶ කීටයා ⟶ ශිෂුවා ⟶ සුහුඹුලා
2. බිත්තර ⟶ ශිෂුවා ⟶ කීටයා ⟶ සුහුඹුලා
3. බිත්තර ⟶ කීටයා ⟶ පිළවා ⟶ සුහුඹුලා
4. බිත්තර ⟶ පිළවා ⟶ කීටයා ⟶ සුහුඹුලා

38. වී වගාවේ දී මඩ ක්‍රමයට බිම් සැකසීමේ ප්‍රධාන පියවර පහත දැක්වේ.

A. පුරන් හීය
B. නියර මඩතැබීම
C. මඩ හීය
D. මඩ කිරීම හා පෝරු ගෑම

ඉහත පියවර ක්ෂේත්‍රයේ ක්‍රියාත්මක කෙරෙන නිවැරදි අනු පිළිවෙල දැක්වෙන පිළිතුර තෝරන්න.

1. A, B, C, D
2. A, C, B, D
3. C, B, A, D
4. B, C, D, A

39. Bg 300 යනු නව වැඩි දියුණු කරන ලද වී ප්‍රභේදයකි. මෙම වී ප්‍රභේදයේ දැකිය හැකි ලක්ෂණයක් නොවන්නේ.

1. ශාකයේ මිටි බව ය.
2. ශාකයේ පළල් සෘජු පත්‍ර පැවතීම ය.
3. ශාක හොඳින් පදුරු දැමීම ය.
4. ශාක උසින් වැඩිවීම ය.

40. වී අස්වනු කල්තබා ගැනීම සඳහා වී බීජවල තිබිය යුතු නිවැරදි තෙතමන ප්‍රතිශතය වන්නේ,

1. 10% - 11%
2. 12% - 13%
3. 14% - 15%
4. 16% - 17%

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත

மாகாணக் கல்வித் திணைக்களம் - வட மத்திய மாகாணம்

Department of Education - North Central Province

තෙවන වාර පරීක්ෂණය - 2022

ශ්‍රේණිය
10

විෂයය - කෘෂි හා ආහාර තාක්ෂණය I, II

පාසලේ නම :- ....

ඇතුළත්වීමේ අංකය :- .... **කාලය : පැය 03**

කෘෂි හා ආහාර තාක්ෂණය II

පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් ඇතුළුව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

01. ගෙවතු වගා තරඟයකට ඉදිරිපත් ව සිටින පාසලක සිසුන්ගේ දෛනික ක්ෂේත්‍ර නිරීක්ෂණ සටහන් කිහිපයක් පහත දැක්වේ.

- ❖ පෙර දින පැවති අධික වර්ෂාවෙන් බෑවුම් සහිත කොටස අධික ලෙස සෝදා යෑම හා බොරළු පෑදී තිබීම.
- ❖ භූමියේ තැන තැන අලෙන සුළු තත්ත්වය.
- ❖ මිරිස් තවානේ සමහර පැළ පාදස්ථ සිහින්ව කඩාවැටීම.
- ❖ කොම්පෝස්ට් ගොඩෙහි අධික රස්නය.

i. එළවළු බෝගවලට අමතරව ගෙවත්තක වගා කළ හැකි වෙනත් ආහාර බෝග කාණ්ඩ හතරක් සඳහන් කරන්න.

ii. බෑවුම සහිත ඉඩමකට වඩාත් සුදුසු ජල සම්පාදන ක්‍රමයක් යෝජනා කරන්න.

iii. ප්‍රධාන පාංශු බාදනකාරක දෙකක් නම් කරන්න.

iv. පස මතුපිටින් ගලායන ජලයේ වේගය අඩු කිරීමට ගතහැකි ක්‍රියාමාර්ග දෙකක් ලියන්න.

v. බොරළු අංශුවක විශාලත්වය කොපමණද?

vi. a) තවාන් පැළවලට වැළදෙන රෝගයක් නම් කරන්න.

b) එහි රෝග කාරක කවරෙක්ද?

vii. තවාන් දමා පැළ සිටුවන බෝග වර්ග දෙකක් නම් කරන්න.

viii. බෝග වගාවේ දී මැටි පසක ඇති ගැටළුවක් ලියන්න.

ix. කොම්පෝස්ට් ගොඩක අධික රස්නය අඩුකිරීමට ලතයුතු ක්‍රියාමාර්ග දෙකක් ලියන්න.

x. පසට කාබනික පොහොර යෙදීමෙන් ලැබෙන වාසි දෙකක් ලියන්න.

02. බෝග වගාවේ දී ඊට බලපාන කාලගුණික පරාමිති පිළිබඳ දැනුවත් වීම ඉතා වැදගත් වේ.



i. a) මෙම රූපසටහනෙහි දැක්වෙන උපකරණය භාවිතයෙන් කරනු ලබන්නේ කුමන කාලගුණික පරිමිතියක් මැනීම සඳහා ද?

b) මෙම උපකරණයේ A, B හා C යන කොටස් නම් කරන්න.

ii. අධික සාපේක්ෂ ආර්ද්‍රතාව බෝග වගාව කෙරෙහි ඇති කරන අහිතකර බලපෑම් තුනක් ලියන්න.

iii. පුෂ්ප හටගැනීමේ දී දිවා කාලයේ දිගට ශාක දක්වන ප්‍රතිචාරය අනුව බෝග කාණ්ඩ තුනකට වෙන්කර දැක්විය හැකි ය. එම බෝග කාණ්ඩ තුන සඳහන් කර, ඒ පිළිබඳව කෙටියෙන් පැහැදිලි කරන්න.

03. බෝග වගාකිරීම සඳහා සුදුසු පසක සංයුතිය ප්‍රශස්ත මට්ටමක පැවතිය යුතුය.

i. a) ශ්‍රී ලංකාවේ දැකිය හැකි ප්‍රධාන පාංශු ව්‍යුහ ආකාර හතර නම් කරන්න.

b) බෝග වගාවේ දී පාංශු වාතයේ ඇති වැදගත්කම් දෙකක් ලියන්න.

ii. පසේ ජීවත් වන පාංශු ජීවීන් වර්ග කර උදාහරණ එක බැගින් ලියන්න.

iii. a) උස් පාත්තියක සම්මත දිග හා පළල සඳහන් කර ඊට හේතුවක් දක්වන්න.

b) වී බෝගය ක්ෂේත්‍රයේ සංස්ථාපනය කරන ක්‍රම දෙකක් සඳහන් කරන්න.

04. ශාක පෝෂණය බෝග අස්වැන්න කෙරෙහි සෘජුවම බලපායි

i. a) වී වගාව සඳහා බිම් සැකසීමේ දී සී සෑමෙන් පසු ක්ෂේත්‍රයට යෙදිය හැකි කාබනික පොහොර වර්ග හතරක් සඳහන් කරන්න.

b) වගා ක්ෂේත්‍රයට කාබනික පොහොර යෙදීම නිසා ලැබෙන ප්‍රයෝජන තුනක් සඳහන් කරන්න.

ii. a) ගොයම් පැළෑටියේ වර්ධන අවධි තුන සඳහන් කරන්න.

b) පැරණි වී ප්‍රභේද සමග සැසදීමේ දී, නව ප්‍රභේද වල දක්නට ලැබෙන විශේෂ ලක්ෂණ හතරක් ලියන්න.

iii. බෝගයකට නයිට්‍රජන් ඌණ වූ විට පෙන්නුම් කරන ලක්ෂණයක් සඳහන් කර ඌණතාවය මගහරවා ගැනීමට භාවිත කළ හැකි රසායනික පොහොර වර්ගයක නම ලියන්න.

05. බිම් සැකසීම මගින් බෝගවල මූල මණ්ඩලයට අවශ්‍ය ප්‍රශස්ත පාංශු පරිසරය ලබාදීමට බලාපොරොත්තු වේ.

i. a) බෝග වගාවේ දී බිම් සැකසීමේ අරමුණු හරතක් ලියන්න.

b) ප්‍රාථමික බිම් සැකසීමේ උපකරණ හතරක් නම් කරන්න.

ii. අතුරුයක් යෑම යන්න කෙටියෙන් හඳුන්වා එහි දී කරන ක්‍රියාකාරකම් දෙකක් සඳහන් කරන්න.

iii. බෝග සංස්ථාපනයේ දී පැළ අතර නිර්දේශිත පරතරය පවත්වා ගැනීමේ වාසි තුනක් සඳහන් කරන්න.

06. සාර්ථක බෝග වගාවන් වල් පැළෑටි පාලනය ඉතා අත්‍යාවශ්‍ය වේ.

i. a) වල් පැළෑටිවල පොදු ලක්ෂණ හතරක් සඳහන් කරන්න.

b) වල් පැළෑටිවලින් බෝග වගාවට සිදුවන හානි හතරක් ලියන්න.

ii. ඒකාබද්ධ වල් පැළෑටි පාලනයේ වාසි දෙකක් ලියන්න.

iii. රසායනික වල්නාශක භාවිතයේ දී අනුගමනය කළ යුතු පිළිවෙත් හතරක් ලියන්න.

07. ශාක රෝග හා පළිබෝධ පාලනය වගාවේ දී ඉතා වැදගත් වේ.

i. a) බෝගවලට වැළදෙන දිලීර රෝගවල පොදු ලක්ෂණ හතරක් සඳහන් කරන්න.

b) වී වගාවට වැළදෙන දිලීර රෝග දෙකක් නම් කරන්න.

ii. ශාක රෝග ඇතිවීම වළක්වාගැනීම (නිවාරණය) සඳහා ගතහැකි ක්‍රියාමාර්ග හතරක් සඳහන් කරන්න.

iii. a) කෘමි නොවන පළිබෝධකයින් දෙදෙනෙක් නම් කරන්න.

b) ගොයම් මැස්සාගේ ජීවන චක්‍රයේ අවස්ථා සඳහන් කරන්න.

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත

மாகாணக் கல்வித் திணைக்களம் - வட மத்திய மாகாணம்

Department of Education - North Central Province

තෙවන වාර පරීක්ෂණය - 2022 (2023)

ශ්‍රේණිය
10

විෂයය - කෘෂි හා ආහාර තාක්ෂණය I, II

පිළිතුරු පත්‍රය

කෘෂි හා ආහාර තාක්ෂණය I කොටස

01. 1	02. 4	03. 2	04. 3	05. 4	06. 2
07. 3	08. 2	09. 1	10. 1	11. 1	12. 2
13. 3	14. 3	15. 4	16. 4	17. 2	18. 3
19. 4	20. 4	21. 4	22. 2	23. 4	24. 3
25. 2	26. 4	27. 2	28. 3	29. 4	30. 2
31. 1	32. 3	33. 2	34. 1	35. 2	36. 4
37. 3	38. 2	39. 4	40. 2		

නිවැරදි පිළිතුරකට ලකුණු 1 බැගින් උපරිම ලකුණු 40 කි.

(ලකුණු 1 x 40)

කෘෂි හා ආහාර තාක්ෂණය II කොටස

01\.
- i. පළාබෝග, අල බෝග, පළතුරු බෝග, තෙල් බෝග, කුළුබඩු බෝග (ල.1/2x4)
- ii. ක්ෂුද්‍ර ජල සම්පාදනය (බිංදු ජල සම්පාදනය)/විසිරි ජලසම්පාදනය (ල.2 x 1)
- iii. වර්ෂා ජලය, සුළඟ, මුහුදු රළ, සතුන්, මිනිස් ක්‍රියාකාරකම් (ල.1 x 2)
- iv. සමෝච්ච ගල්වැටි යෙදීම, හෙල්මළු සැකසීම, කානු සකස් කිරීම. (ල.2 x 1)
- v. අංශුවක විශ්කම්භය මි.මි. 2 ට වඩා වැඩි අංශු (ල.2 x 1)
- vi. a. දියමලන් කැම (ල.1 x 1)
  - b. දිළීර (ල.1 x 1)
- vii. තක්කාලි, බටු, මිරිස්, බී ලූණු, ගෝවා (ල.1 x 1)
- viii. වියළි විට තද බව, තෙත් විට ඇලෙන සුළු බව (ල.2 x 1)
- ix. වසා ඇති ගොඩක් නම් ආවරණය ඉවත් කිරීම, නිතර නිතර පෙරළීම. (ල.1 x 2)
- x. විවිධ පෝෂක ලැබීම, පසේ ව්‍යුහය දියුණු වීම, පසේ කැටායන හුවමාරුව වැඩිවීම, පසට ස්වාරක්ෂණයක් ලෙස කටයුතු කිරීම, පසේ ජල අවශෝෂණය වැඩිවීම.

(ල.1 x 2)

02\.
- i. a. වර්ෂාව (ල.1 x 1)
  - b. A – පුනිලය, B – ඇතුලත ආවරණය, C – ජලය රැස්වන බඳුන (ල. 1/2x3)

ii. ශාක රෝග ආසාධනය වැඩිවේ. කෘමි පළිබෝධ ව්‍යාප්තිය වැඩි වේ. ජල අවශෝෂණය අඩු වී ශාක පෝෂක අවශෝෂණය අඩු වේ. ගබඩා බීජ කෘමි හා ශාක පළිබෝධවලට ගොදුරු වේ.

(ල.1/2 x 3)

iii. කෙටි දින ශාක - පුෂ්ප හටගැනීම සඳහා කෙටි දිවා කාලයක් අවශ්‍ය ශාක.

දිගු දින ශාක - පුෂ්ප හටගැනීම සඳහා දිගු දිවා කාලයක් අවශ්‍ය ශාක

දිගු උදාසීන ශාක - පුෂ්ප හටගැනීම සඳහා දිවාකාලයේ බලපෑමක් නැති ශාක

නම් කිරීමට - ලකුණු 1 x 3

විස්තර කිරීමට - ලකුණු 1 x 3

03. i. a. තනි කනිකා ව්‍යුහය, ස්ථම්භාකාර ව්‍යුහය, කැටිති ව්‍යුහය, අනු කෝණාකාර ව්‍යුහය

(ල.1 x 4)

b. බීජ ප්‍රරෝහණයට මූල මණ්ඩලයේ ශ්වසනයට, පාංශු ජීවීන්ගේ ස්වසනයට, පාංශු ජීර්ණයට (ල.1/2 x 2)

ii. පාංශු ජීවීන්

මහා ජීවීන්	**ක්ෂුද්‍ර ජීවීන්** (ල. 1 x 1)
වේයන්	ඇල්ගී
ගැඩවිලා	බැක්ටීරියා
හැකරැල්ලා	දිලීර
(ල.1/2 x 1)	නෙමටෝඩාවන් (ල.1/2 x 1)

iii. a - දිග මීටර් 03 යි - නඩත්තු කටයුතු පහසුවීම

පළල මීටර් 01 යි - නඩත්තු කටයුතු පහසුවීම (ල.1/2 x 4

b - වැපිරීම, පැළ සිටුවීම (ල.1 x 1)

04. i. a. ඇලිබීසියා, ගොමපොහොර, කුකුළු පොහොර, කොම්පෝස්ට්, ඉපිල් ඉපිල්, අඬනහිරියා (ල.1/2 x 4)

b. සියළු පෝෂක අඩංගු පූර්ණ පොහොරකි. අඩු වේගයෙන් පෝෂක ලබාදේ. පසේ, කැටායන හුවමාරු ධාරිතාව වැඩි කරයි. ජල අවශෝෂක හැකියාව වැඩි කරයි. පසේ ක්ෂුද්‍ර ජීවී ගහනය වැඩි කරයි. (ල.1/2 x 3)

ii. a. 1.වර්ධක අවධිය 2. ප්‍රජනක අවධිය 3. මේරීමේ අවධිය (ල.1/2 x 3)

b. ශාක මිටිය. ඇද වැටීමට ඔරොත්තු දේ, පඳුරු දැමීම වැඩිය, හොඳ පොහොර ප්‍රතිචාරය, අස්වනු වැඩිය (ල.1/2 x 4

iii. a. ඌනතා ලක්ෂණ - පහළ පත්‍ර කහ පැහැවීම, කුරුවීම, වර්ධනය බාල වීම, මල් හා ඵල විකෘතිවේ.

(ල.1 1/2 x 1)

b අඩංගු රසායනික පොහොර - ඇමෝනියම්, යූරියා (ල.1 1/2 x 1)

05. i. a. වල්පැළෑටි මර්ධනය, පාත්ති සැකසීම, පසට කාබනික පොහොර එකතු කිරීම, ජලවහනය දියුණු කිරීම, වැටි හා කාණු සැකසීම, පසු සියුම්ව සැකසීම

(ල.1/2 x 4)

b. උදැල්ල, හැඩලෑලි නගුල, වෝල්බෝඩ් නගුල, තැටි නගුල, ගැමි නගුල , යකඩ නගුල (ල.1/2 x 4)

ii. 1. විස්තරය :- අතුරුයත් ගැට යනු බෝගයක් ක්ෂේත්‍රයේ සිටුවීමෙන් පසු පසට සිදුකරන ක්‍රියාකාරකම්ය. (ල.1 x 1)

2. ක්‍රියාකාරකම් :- පස බුරුල් කිරීම, වල් මර්ධනය, ගස් ලඟට පස් ලං කිරීම, පසට පොහොර යෙදීම. (ල.1 x 2)

iii. 1. වල්පැල පාලනය පහසුය 2. රෝග හා පළිබෝධ ව්‍යාපාරය අවම වේ.
3. පොහොර යෙදීම පහසුය. 4. බීජ සඳහා යන වියදම අවම කරගත හැක.

(ල.1 x 3)

06. i. a. අහිතකර තත්ව යටතේ වුව ද හොඳින් වර්ධනය වේ.
සීඝ්‍රයෙන් පැතිරේ.
පළිබෝධ හානිවලට ඔරොත්තු දෙයි.
ජීවන චක්‍රය කෙටිය.
ශක්තිමත් මූල පද්ධතියක් සහිතය.
විවිධ ක්‍රම මගින් ව්‍යාප්ත වේ. (ල.1/2 x 4)

b. වල්පැළෑටිවලින් සිදුවන හානි
1. පෝෂක, ජලය, ඉඩකඩ හා හිරු එළිය සඳහා බෝගය සමඟ තරඟ කිරීම.
2. අස්වනු සමඟ වල් පැළ බීජ මිශ්‍ර වී අස්වනු බාල කිරීම.
3. ක්ෂේත්‍ර කටයුතු අපහසු වීම.
4. කෘමින්කාරක ශාක ලෙස කටයුතු කිරීම. (ල. 1/2x 4)

ii. ඒකාබද්ධ වල් පැල පාලනයේ වාසි
1. පරිසර දූෂණය අවම වීම 2. වියදම අඩුවීම
3. හිතකර ජීවීන් විනාශ වීම අඩුවීම. (ල.1 x 2)

iii. 1. සුදුසු වල් නාශකයක් තෝරාගැනීම.
2. නියමිත වේලාවට යෙදීම.
3. යොදන්නා ආරක්ෂිතව සූදානම් වීම.
4. යෙදීමෙන් පසු පිරිසිදු වීම.
5. යෙදීමට පෙර කාලගුණික තත්වය විමසීම (ල.1 x 4)

07. i. a. දිලීර රෝගවල පොදු ලක්ෂණ
පුල්ලි ඇතිවීම, අංගමාරය, මැලවීම, තෙත් හා වියළි කුණු වීම
මලකඩ ඇතිවීම, පිටිපුස් ඇතිවීම (ල.1/2 x 4)

b. වී වගාවේ දිලීර රෝග
1. කොපු අංගමාරය 2. කොළ පාලුව (ල. 1/2X2)

ii. රෝග නිවාරණයට ගත හැකි ක්‍රියාමාර්ග

1. පිරිසිදු බිත්තර බීජ භාවිතය
2. වගාවේ වල්පැල පාලනය
3. ප්‍රතරෝධි ප්‍රභේද වගාකිරීම
4. යාය එකවර වගාකිරීම
5. වගාව පිරිසිදුව තබාගැනීම (ල. 1/2x 4)

iii. a. මයිටාවන්, පක්ෂීන්, මාද්වංශීන්, ක්ෂරපායින් (ල. 1 x 2)

b. බිත්තර ⟶ සිසුවා ⟶ සුහුඹුලා

(අර්ධ රූපාන්තරණය) (ල. 1 x 3)

LOL.lk
BookStore
විභාග ඉලක්ක
පහසුවෙන් ජයගන්න
ඕනෑම පොතක් ඉක්මනින්
නිවසටම ගෙන්වා ගන්න
| කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් | සඟරා | O/L ප්‍රශ්න පත්‍ර
| A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත්
| School Book | ගුරු අත්පොත්
pesuru Prakashana Private Ltd.
Akura Pilot
සමනල දැනුම
T
සතර
පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර,
කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා
සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට
www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න